# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1476/1 – 2006 දෙසැම්බර් 18 වැනි සඳුදා – 2006.12.18

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

### පළාත් සභා නිවේදන

මධ්‍යම පළාත් සභාව

1990 අංක 17 දරන මුදල් ප්‍රඥප්තිය

7 වන වගන්තිය යටතේ නියෝගය

මධ්‍යම පළාතේ පළාත් සභාවේ 1990 අංක 17 දරන මුදල් ප්‍රඥප්තියේ 7 වන වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා මුදල්, හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන, අධ්‍යාපන, ප්‍රවාහන, සංචාරක, වෙළඳ හා වාණිජ, සංස්කෘතික, පරිසර ඉඩම්, නිවාස, ඉදිකිරීම්, මානව සම්පත් සංවර්ධන, දේශීය විදේශීය ආයෝජන පිළිබඳ අමාත්‍ය සරත් ඒකනායක වන මම, පහත සඳහන් පිරිවැටුම් බදු අනුප්‍රමාණයන් මෙම නියෝගය මගින් 2007 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයින් නියම කරමි.

| | | |
|---|---|---|
| (අ) | ඉරන ලද ලී හෝ ලී කොට වශයෙන් දැව මිළට ගෙන විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම් සම්බන්ධයෙන් | සියයට 05 |
| (ආ) | මුතු මැණික්, වටිනා හෝ අර්ධ වශයෙන් වටිනා ගල් මිළට ගෙන විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් | සියයට 05 |
| (ඇ) | රත්‍රං මිළට ගෙන විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් | සියයට 05 |
| (ඈ) | ගෘහ භාණ්ඩ (වාහේ ගෘහ භාණ්ඩ ද ඇතුළත්ව) මිළට ගෙන විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් | සියයට 05 |
| (ඉ) | ස්වර්ණාභරණ සහ ඇඳුම් ආයිත්තම් සඳහා වූ ස්වර්ණාභරණ මිළට ගෙන විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් | සියයට 05 |
| (ඊ) | අරක්කු, (පදම් කළ අරක්කු, කලවම් අරක්කු ඇතුළුව) බීර, වයින්, රා හා වෙනත් ආනයනික හෝ මෙරට නිෂ්පාදිත මත්පැන් වර්ග මිළට ගෙන විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් | සියයට 05 |
| (උ) | සිගරැට් නිෂ්පාදකයා වෙතින් හෝ සිගරැට් ආනයනකරු වෙතින් මිළදී ගෙන සිගරැට් විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් | සියයට 05 |
| (ඌ) | ඉහත (අ), (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ) සහ (උ) යටතේ සඳහන් යම් ව්‍යාපාරයක් හැර යම් ද්‍රව්‍යයක් හෝ භාණ්ඩයක් මිළට ගෙන විකිණීමේ ව්‍යාපාරවල පිරිවැටුම සම්බන්ධයෙන් | සියයට 01 |


IA - PH 006646 - 535 (2006/12)

අති විශෙෂ ගැසට් අංක 1475/1 කාණ්ඩය 1475/21 න් අවසන් වේ.

02. ඉහත (1) ඡේදයේ සඳහන් නියෝගය ක්‍රියාත්මක වීමෙන් පසුව උද්ගතවන යම් පිරිවැටුමක් සම්බන්ධයෙන් ඉහත කී මුදල් ප්‍රඥප්තියේ 7 වන වගන්තිය යටතේ සාදන ලදුව 1990 දෙසැම්බර් 28 වැනි දින සහ අංක 642/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද නියෝගය සහ එම නියෝගයට පසුව කරන ලද සංශෝධන නියෝගද 2006 ඔක්තෝබර් මස 17 වැනි දින හා අංක 1467/14 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* කරන ලද නියෝගයද 2006 දෙසැම්බර් 31 දිනෙන් පසුව අදාළවීම මෙයින් අහෝසි කරනු ලැබේ.

සරත් ඒකනායක,
මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා මුදල්, හා
ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන,
අධ්‍යාපන, ප්‍රවාහන, සංචාරක, වෙළඳ හා වාණිජ,
සංස්කෘතික, පරිසර ඉඩම්, නිවාස, ඉදිකිරීම්, මානව
සම්පත් සංවර්ධන, දේශීය විදේශීය
ආයෝජන පිළිබඳ අමාත්‍ය.

2006 දෙසැම්බර් මස 14 වැනි දින,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලය,
මහනුවර.

01-21